## 306 සුරලොවේ සුර පියේ

සුරලොවේ සුරපියේ අසනු අප යැදුම් අනේ //

දින දින ඔබ නම ලොව සැම තැන පැතිරේවා
ඔබ රජකම සැම දන හට සෙවන ගෙනේවා

ඔබ රිසි දෙය සුරලොව මෙන් මෙහි ඉටුවේවා
අප කුස ගිනි නිවාලන්න අහර ලැබේවා

මට කළ වරදට අනුනට සමාව දෙමි මා
මම කළ වරදට මා හට සමාව ලැබෙවා

සැම විට වරදට පෙළඹෙන මා ගැන සලකා
උවදුරු සැම ජය ගන්නට සරණය ලැබේවා